කාර්යාල ප්‍රයෝජනයසඳහා පමණි
ලියාපදිංචි අංකය :- RJ/FM/BD/......................

ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
සාලියපුර, අනුරාධපුර

# මෘතදේහ ප්‍රදානය කිරීමේ පොරොන්දු පත්‍රය

.................................................................................................................(නිවැරදි ලිපිනය) පදිංචි .................................................................................................(සම්පූර්ණ නම) වන මා විසින් මරණින් පසු මාගේ දේහය වෛද්‍ය පර්යේෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨයට භාරදීමට පොරොන්දු වෙමි. මා දන්නා තරමින් මේ සඳහා මාගේ පාර්ශවයේ කිසිදු බාධාවක් නොමැති බවද දන්වා සිටිමි.

නම :........................................................
අත්සන :........................................................
ජාතික හැඳුනුම්පත් අංකය :........................................................
දුරකථන අංකය (ඇත්නම්) :........................................................

## <u>පරිත්‍යාගශීලියාගේ ආසන්න ඥාතියා / භාරකරුගේ ප්‍රකාශය</u>

ඉහත සඳහන් ඉල්ලීම සම්බන්ධයෙන් මා දැනුවත් කර ඇති බවද ඒ පිළිබඳ විරෝධතාවයක් නොමැති බවද දන්වා සිටිමි.

නම :........................................................
අත්සන :........................................................
ජාතික හැඳුනුම්පත් අංකය :........................................................
පරිත්‍යාගශීලියාට ඇති ඥාති සම්බන්ධතාවය :........................................................

........................................................................... ඉල්ලීම පරිදි මෘත දේහ ප්‍රදානය කරන්නෙක් වශයෙන් වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨයේ ලියාපදිංචි කරගත් බව දන්වා සිටිමි.

අංශප්‍රධාන
කායව්‍යවච්ඡේද්‍ය දෙපාර්තුමේන්තුව

පීඨාධිපති
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය

❖ සැ.යු. ලියාපදිංචි වී සිටියද මියගිය පසු වෛද්‍ය පීඨයෙන් නිකුත් කළ උපදෙස් පත්‍රිකාවේ කරුණු සම්පූර්ණ වේ නම් පමණක් දේහය භාරගන්නා බව දන්වා සිටිමි.

පීඨාධිපති,
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය,
සාලියපුර,
අනුරාධපුර
20....................

ස්වාමින්වහන්ස/ පූජකතුමනි,
මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනවියනි,

**<u>වෛද්‍ය පර්යේෂණ සඳහා ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාල වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨයට මෘතදේහ පරිත්‍යාග කිරීම.</u>**

ඔබගේ .......................... දින දරණ ලිපියට / ඉල්ලීමට බෙහෙවින් ස්තුතිවන්ත වන අතර මරණින් පසු ඔබේ දේහය වෛද්‍ය පර්යේෂණ සඳහා ප්‍රදානය කිරීමට ඔබ තුල ඇති පරමාර්ථය බෙහෙවින් අගය කරමින් මෘත දේහය ප්‍රදානය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු ඔබ වෙත ඉදිරිපත් කරමි.මරණින් පසු දේහයක අයිතිය ඥාතීන් හෝ භාරකරුවන් සතුවන බැවින් ඔබ මෙන්ම ඔවුන් ද පහත සඳහන් උපදෙස් පිළිපැදීම / දැනුවත් වී තිබීම ඉතා වැදගත් වනු ඇත.

01. මෘත දේහය ප්‍රදානය කිරීමට පොරොන්දු පත්‍රයක් මගින් පීඨයෙහි ලියාපදිංචි වී ඇති මෘතදේහ පමණක් භාර ගන්නා අතර මියගිය පසු දේහය ප්‍රදානය කිරීම සිදුකරන්නේ ඥාතීන්/ භාරකරුවන් බැවින් ඔවුන් දැනුවත් කර තිබීම ඉතා වැදගත් වේ.

02.

I. තම දේහය ප්‍රදානය කිරීමට අදහස් කළ අයෙකු මියගිය විගසම ඒ බව ඥාතීන් / භාරකරුවන් විසින් සඳුදා සිට සිකුරාදා දක්වා (රජයේ සේවා ස්ථාන විවෘත කර ඇති දිනවල) පෙ.ව. 8.00 සිට 3.00 දක්වා ඉහත ලිපිනයේ පිහිටි කායව්‍යවච්ඡේද්‍ය විද්‍යා අධ්‍යනාංශයට පැමිණ දැන්වීමෙන් හෝ දුරකථනයෙන් දැන්වීමෙන් මෘතදේහය රැගෙන ආ විට ඉතා ඉක්මණින් ඒ සම්බන්ධයෙන් කටයුතු කළහැක. මෙය දන්වන අවස්ථාවේදී මෘත දේහ ප්‍රදානය කිරීමේ පොරොන්දු පත්‍රයේ ලියාපදිංචි අංකය අත්‍යවශ්‍ය බව සලකන්න.

II. සතියේ දින වල දේහයක් භාරදිය හැකිකේ පෙ.ව.8.00 සිට ප.ව.3.00 දක්වා පමණක් බව සලකන්න.

III. සති අන්තයේ සහ රජයේ නිවාඩු දිනවලදී මරණය සිදුවූ විටදී දේහය භාරගැනීමේ කටයුතු පිළිබඳව දෙපාර්තමේන්තු ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු අමතා අදාල කටයුතු සූදානම්කර ගත යුතුය.

03.

I. මරණයසිදු වී පැය 12ක් ඉක්මවා යන අවස්ථාවකදී පහත (04) සඳහන් ආකාරයට දේහය ස්වරක්ෂණය කළයුතු බවකරුණාවෙන්සලකන්න.

II. එම ආකාරයට ස්වරක්ෂණය කල දේහයක් වුවද මරණය සිදුවී පැය 48ක් ඇතුලත අධ්‍යනාංශය වෙත භාරදියයුතු බව කරුණිකව සිහිපත් කරමි.

04. දේහය ස්වරක්ෂණය කරන තැනැත්තාට / අවමංගල්‍ය සේවා ආයතනයට පහත සඳහන් උපදෙස් දෙන මෙන් ඉල්ලමි.

I. ස්වරක්ෂණය කළ යුත්තේ කලවා පෙදෙසේ ඉහළ කොටසේ ඇති ප්‍රධාන ධමනිය තුලින් පමණි.

II. ශරීරයේ අවයවයන් ඉවත් කිරීමට හෝ වෙනත් කොටසක් කැපීම සිදු නොකළ යුතුය. (අක්ෂිදාන සංගමයට ඇස් දන්දීම පමණක් සිදුකළ හැක.)

III. ස්වරක්ෂණය කිරීමේදී 40%ක ෆෝමලීන් ද්‍රාවණයකින් අවම වශයෙන් ලීටර දෙකක්වත් ඉහත සඳහන් ආකාරයට රුධිර නාලය තුලින් ඇතුළු කළ යුතුය.

ඉහත සඳහන් ආකාරයට හැර වෙනත් ආකාරයට ස්වරක්ෂණය කළ දේහයක් කිසිම අන්දමින් වෛද්‍ය පීඨයට භාර නොගන්නා බව සැලකිල්ලට ගත යුතු බව දන්වමි. එබැවින් ඉහත සඳහන් ලෙස ස්වරක්ෂණය කල බව අවමංගල සේවා ආයතනයෙන් ලිඛිතව දන්වා සිටීම අවශ්‍ය බව සලකන්න.

05. දේහය වෛද්‍ය පීඨයට භාරදීමේදී අනිවාර්යයෙන් සැපයිය යුතු කරුණු

I. දේහය භාරදෙන ඥාතීන් හෝ භාරකරුවන් සිය හැඳුනුම්පත සමග ඉදිරිපත් වියයුතුය.

II. මරණය ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළයුතුය.

III. දේහය සිය කැමැත්තෙන් පීඨයට ප්‍රදානය කරන බව ඥාතීන් හෝ භාරකරුවන් විසින් ලිඛිතව ප්‍රකාශ කළයුතුය.

IV. අදාල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිතුමාට මේ බව දැනුම් දී තිබිය යුතුය.

V. මරණය ලියාපදිංචි කිරීමේ ලේඛණයෙහිද 7 වන කොටුවේ ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාල වෛද්‍ය පීඨය, කායව්‍යවච්ඡේද්‍ය විද්‍යා දෙපාර්ථමේන්තුව ලෙස සඳහන් කළ යුතුය.

06.

I. පහත සඳහන් හේතුන් එකක් හෝ ඇත්නම් පීඨය විසින් මෘතදේහ භාර නොගන්නා බව කරුණාවෙන් සලකන්න.

a. වයස අවු:18ට අඩු පුද්ගලයන්ගේ මෘතදේහ

b. උපතින්ම සිදුවූ අවයව විකෘති වීම.

c. සමේ තුවාල,දද, කුෂ්ඨ වැනි ආසාදන

d. පිළිකා රෝග

e. දිගුකලක් එක්තැන්ව සිටීමෙන් හටගත් ඇඳ තුවාල

f. මෙනින්ජ ප්‍රදාහය,ක්ෂය රෝගය,සෙංගමාලය,එච්.අයි.වී (ඒඩ්ස්)

II. කෙනෙකු මිය යන්නට පෙර,

a. හදිසි අනතුරකට භාජනය වී දැඩි ලෙස තුවාල ලබා සිටියේ නම්

b. බරපතල ශල්‍යකර්මයකට භාජනය වී අවයව, ඉන්ද්‍රයයන් ඉවත් කර තිබුනේ නම්

III. මියගිය පසු පශ්චාත් මරණ පරීක්ෂණයකදී දේහය ව්‍යවච්ඡේදනය කර ඇත්නම්,

a. දේහයක් පීඨයට භාරදීම පිළිබඳව සාකච්ඡා කිරීමට ඥාතීන් හෝ භාරකරුවන් පැමිණි විට දේහයේ තත්වය අනුව භාරගැනීමට සුදුසු / නුසුදුසු බව ඔවුන්ට දන්වනු ලැබේ. වෛද්‍ය පර්යේෂණ සඳහා භාවිතාවන්නේ සාමාන්‍ය තත්ත්වයේ දේහයන් වන බැවින් ඉහත ආකාරයේ දේහයන්ගෙන් පීඨයට ප්‍රයෝජනයක් නොමැත.

b. අධ්‍යනාංශයේ මෘතදේහ ගබඩාකර තබා ගැනීමේ සීමාව සම්පූර්ණ වන අවස්ථාවලදී සහ දේහයේ ඉහත සඳහන් තත්ත්වයන් එකක් හෝ ඇතිනම් එම අවස්ථාවලදී ඉතා කණගාටුවෙන් වුවත් (පෙර ලියාපදිංචි වී සිටිය ද)එම සිරුර භාර ගැනීමට නොහැකි වන බව කරුණාවෙන් සලකන්න.එබැවින් දේහය රැගෙන ඒමට පෙර ඒ පිළිබඳව අධ්‍යනාංශයෙන් විමසා තහවුරු කර ගැනිම අත්‍යවශ්‍ය බව කරුණාවෙන් සලකන්න.

c. ඔබට මේ පිළිබඳව විස්තර හෝ පැහැදිලිකිරීමක් අවශ්‍යනම් කායව්‍යවච්ඡේද්‍ය අංශයේ දුරකථන අංකය මඟින් වැඩි විස්තර ලබා ගත හැකි අතර පහත සඳහන් දුරකථන අංකවලට අමතන්න.

| | |
|---|---|
| කායව්‍යවච්ඡේද්‍ය අංශය | 025 - 2234465 |
| වෛද්‍ය එස්.එම්.ඒ.ජයවර්ධන (අංශප්‍රධාන) | 071 - 8076137 |
| වෛද්‍ය සී.එස්.පත්තිනිගේ (කථිකාචාර්ය) | 075 - 9251072 |
| ඩබ්.එම්.පී.සී.වීරසුන්දර මෙය (කාර්මික නිලධාරිනි) | 071 - 2797577 |
| කේ.එන්. ලියනගේ මෙය (කාර්මික නිලධාරිනි) | 076 - 8658283 |
| එස්.එම්.ආර්.පී.බණ්ඩාර මයා | 077 - 4274986 |
| ඩබ්.ඒ.නිල්මිණි සිරිවර්ධන මිය | 071 - 4912088 |
| පී.ලසන්ත තිලකරත්න මයා | 077 - 3273497 |
| පී.බී.නන්දන පුෂ්පකුමාර මයා | 071 - 8768359 |
| ඊ.එම්.ජානක මයා | 077 - 5856154 |

07. මෘතදේහයක් භාරදීමට පැමිණෙන පුද්ගලයන් පහත දැක්වෙන කරුණු කෙරෙහි තම අවධානය යොමු කළයුතුය.

I. පීඨය විසින් ප්‍රවාහන පහසුකම් සපයනු නොලැබේ.

II. පීඨය විසින් දේහයක් භාරගත් පසුව කිසිම හේතුවක් නිසා නැවත දැකබලා ගැනීමට කිසිවෙකුට අවසර නොලැබේ.

III. පීඨය තුල ආගමික වතාවත් හෝ වෙනයම් උත්සවයක් පැවැත්වීමට ඉඩදෙනු නොලැබේ.

IV. දේහයේ කිසිම කොටසක් ඥාතීන්ට හෝ භාරකරුට නැවත ලබා දෙනු නොලැබේ.

V. දේහය අඩංගු පෙට්ටිය, ඇඳුම් හා ආභරණ සියල්ලම දේහය භාරගත් විගසම භාරකරුවන් වෙත නැවත භාරදෙනු ලැබේ.

VI. දේහය ප්‍රදානය කිරීම වෙනුවෙන් පීඨය කිසිදු ගාස්තු අයකිරීමක් හෝ ගෙවීමක් සිදුකරනු නොලැබේ.

VII. දේහය භාරදෙන අවස්ථාවේදී අදාල භූමිය හෝ එම ස්ථානයේ පසුබිම ඡායාරූපයකට නැගීමට,වීඩියෝගත කිරීමට ඉඩදෙනු නොලබයි.

**විශ්ව විද්‍යාලය තුල ඡායාරූප ගැනීමට අවසරයක් නොමැත.**

08. ඔබගේ මෘත දේහ භාරදීමේ පොරොන්දු පත්‍රය පමණක් (මෙම විස්තර ලිපිය රහිතව) පහත ලිපිනය වෙත යොමුකරන්න.

අංශප්‍රධාන
කායව්‍යච්ඡේද්‍ය අංශය
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය
ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය
සාලියපුර

පීඨාධිපති
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය

**Prof. SISIRA SIRIBADDANA**
MBBS MD FCCP FRCP Edin
Professor of Medicine & Chair
**Dean**
Faculty of Medicine & Allied Sciences
Rajarata University of Sri Lanka